# ආර්ථික පසුබිම

මහනුවර දිස්ත්‍රික්කයේ, 2018 වසර සඳහා ඇස්තමේන්තුගත ජනගහණය 1,468,034 ක් වන අතර එය දිවයිනේ මුළු ජනගහණයෙන් 6.8 % ක් නියෝජනය කරනු ලබයි. දිස්ත්‍රික්කයේ ජනගහණ ඝනත්වය 2018 වසරේ දී, වර්ග කිලෝමීටරයට පුද්ගලයින් 757 කි. වැඩිම ජනගහණ ඝනත්වයක් වාර්තා වූ ප්‍රා.ලේ. කොට්ඨාස 03 වන්නේ පිළිවෙලින් ගඟවට කෝරළේ, අකුරණ හා හාරිස්පත්තුවයි. අඩුම ජනගහණ ඝනත්වයක් වාර්තා වන්නේ උඩදුම්බර ප්‍රා.ලේ. කොට්ඨාසයෙනි.දිස්ත්‍රික් ජනගහණයෙන් 12.4% ක් ජීවත්වනුයේ නාගරික අංශයේ වන අතර 81.4% ක් ග්‍රාමීය අංශයේ හා 6.2% ක් වතු අංශයේ ජීවත් වෙති. නාගරික ජනගහණය බහුලව පැතිර පවත්නේ ගඟවට කෝරළේ හා උඩපළාත ප්‍රා.ලේ. කොට්ඨාසයන්හි වන අතර එය සමස්ත නාගරික ජනගහණයෙන් 77% කි. වතු අංශයේ ජනගහණය වැඩි වශයෙන් පස්බාගේ කෝරළේ, පන්විල, උඩපළාත හා දෙල්තොට යන ප්‍රා.ලේ. කොට්ඨාසයන්හි ජීවත් වන අතර, එය දිස්ත්‍රික්කයේ සමස්ත වතු අංශයේ ජනගහණයෙන් 60% කි.

දිස්ත්‍රික්කයේ ප්‍රධාන කෘෂිකාර්මික බෝගයන් වනුයේ තේ, වී හා ගම්මිරිස්, කරාබුනැටි වැනි සුළු අපනයන බෝගයන් වේ. තේ අක්කර 52,591 (2013/14 ආර්ථික සංගණනය) වගාකර ඇති අතර එයින් 40% ක් කුඩා තේ වතු අංශයට අයත් වන අතර ඉතිරි 60% වතු අංශයට අයත් වේ. වැඩිම තේ වගාවක් සිදුකරනු ලබන ප්‍රා.ලේ. කොට්ඨාසය වනුයේ පස්බාගේ කෝරළේ වන අතර ප්‍රධාන වශයෙන් තේ වගා කෙරෙන අනිකුත් ප්‍රා.ලේ. කොට්ඨාස වනුයේ පන්විල, ගඟඉහල කෝරළේ, දොළුව, උඩපළාත, මැදදුම්බර, යටිනුවර හා දෙල්තොට යි. කුඩා තේ වතු වැඩිමනත් බිම් ප්‍රමාණයක් වගා කෙරෙනුයේ ගඟඉහල කෝරළේ ප්‍රා.ලේ. කොට්ඨාසයේ වන අතර කුඩා තේ වතු බහුල අනිකුත් ප්‍රා.ලේ. කොට්ඨාස වනුයේ දොළුව, යටිනුවර, උඩපළාත, පස්බාගේ කෝරළේ, උඩුනුවර හා පූජාපිටිය යි. වතු අංශයේ වැඩිම තේ වගාවක් වාර්තා වනුයේ පන්විල ප්‍රා.ලේ. කොට්ඨාසයෙන් වන අතර වතු අංශයේ තේ වගාව ප්‍රධාන වශයෙන් සිදුකරනු ලබන ප්‍රා.ලේ. කොට්ඨාසයන් වනුයේ පස්බාගේ කෝරළේ, මැදදුම්බර, උඩපළාත, ගඟඉහල කෝරළේ, දොළුව හා දෙල්තොට යි.

දිස්ත්‍රික්කයේ රබර් වගා කෙරෙන බිම් ප්‍රමාණය අක්කර 5,573 (2013/14 ආර්ථික සංගණනය අනුව) කි. එය ප්‍රධාන වශයෙන් හතරලියද්ද, යටිනුවර හා තුම්පනේ යන ප්‍රා.ලේ. කොට්ඨාසවල වගා කෙරේ.මුළු රබර් වගා කෙරෙන බිම් ප්‍රමාණයෙන් 83% ක් කුඩා රබර් වතු අංශයට අයත් වේ.

වී වගාව සඳහා අස්වද්දන ලද බිම් ප්‍රමාණය අක්කර 35,628 ක් වන අතර එයින් 30.2% ක් විශාල වාරිමාර්ග ක්‍රම යටතේ ද, 45.0%ක් සුළු වාරිමාර්ග ක්‍රම යටතේ ද, 24.8% ක් වර්ෂා පෝෂිත යටතේ ද අස්වද්දා ඇත. විශාල වාරිමාර්ග ක්‍රම යටතේ අස්වද්දන ලද වැඩිම බිම් ප්‍රමාණය මිණිපේ ප්‍රා.ලේ. කොට්ඨාසයේ වන අතර සුළු වාරිමාර්ග ක්‍රම යටතේ අස්වද්දන ලද වැඩිම බිම් ප්‍රමාණය උඩදුම්බර ප්‍රා.ලේ. කොට්ඨාසයෙන් වාර්තා වේ.

දිස්ත්‍රික්කයේ වගා කෙරෙන ප්‍රධාන සුළු අපනයන බෝග අතරින් ගම්මිරිස්, කරාබුනැටි හා කෝපි බිම් ප්‍රමාණයන් පිළිවෙලින් අක්කර 17475, 7472 හා 6821 වේ. මෙම බෝගයන් මැදදුම්බර, පූජාපිටිය, උඩදුම්බර, කුණ්ඩසාලේ, ගඟඉහල කෝරළේ, උඩුනුවර, හතරලියද්ද, දොළුව හා පාතහේවාහැට ප්‍රා.ලේ. කොට්ඨාසයන්හි බහුලව වගා කෙරේ.

2013/14 ආර්ථික සංගණනයට අනුව දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක ප්‍රධාන කර්මාන්ත වන්නේ රෙදිපිලි, ඇගළුම්, සම් භාණ්ඩ, ආහාර පාන වර්ග හා දුම්කොල, දැව, දැව නිෂ් පාදන හා ගෘහ භාණ්ඩ හා අලෝහමය ඛණිජ නිෂ්පාදන ආදියයි. ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක ජාත්‍යන්තර කර්මාන්තශාලා රැසත් පල්ලේකැලේ ප්‍රදේශයේ පිහිටුවා ඇත.

දිස්ත්‍රික්කයේ යැපුම් අනුපාතය 2018 වසරේ දී 64.0 ක් වූ අතර ළමා යැපුම් අනුපාතය 41.8 හා වැඩිහිටි යැපුම් අනුපාතය 22.2 විය. 2012/13 ආදායම් වියදම් සමීක්ෂණයට අනුව, මහනුවර දිස්ත්‍රික්කයේ ගෘහ ඒකකයක මධ්‍යන්‍යය මාසික ආදායම රුපියල් 43,138 වන අතර ගෘහ ඒකකයක මධ්‍යස්ථ මාසික ආදායම රුපියල් 30,371 විය. එම සමීක්ෂණයටම අනුව, දිස්ත්‍රික්කයේ ජනගහනණ දරිද්‍රතා අනුපාතය 6.2%. ක් විය.

# Economic Background

Estimated Population for Kandy district in year 2018 was 1,468,034 and it represents 6.8 % of Island wide population. Population density in the district is 757 persons per square Kilo Meters in 2018. The three D.S divisions which reported the highest population density in Kandy district are Gagawata Korale, Akurana and Harispaththuwa respectively. The lowest population density is reported from Ududumbara D.S division. While 12.4% population are dwelling in the urban sector and 81.4% in rural sector and 6.2% in estate sector. Urban population is highly distributed in Ganga Wata and Udapalatha D, S divisions which are representing 77% of Total Urban population. Estate sector. Population is highly spread in Pasbage Korale, Panvila, Udapalatha, Delthota D.S Divisions and approximately it is 60% of district total estate population.

Main agricultural crops in the district are Tea, Paddy and Export crops such as Pepper, Cloves and Coffee etc. Tea is cultivated in 52,591 Acres (2013/14 Economic census) and 40% of it belongs to the small Holding sector and other 60% are in estate sector. The highest Tea cultivation is in the Pasbage Korale D.S Division and Panvila, Gangaihala, Doluwa, Udapalata, Medadumbara,Yatinuwara, and Deltota are other mainly Tea growing D,S Divisions. The highest Tea small holdings acreage in Ganga Ihala D.S Division and Doluwa.Yatinuwara. Udapalatha. Pasbage Korale. Udunuwara.Poojapitiya are other largely tea small holdings spread D.S Divisions. When consider the estate sector tea cultivation, the highest acreage is reported from Panvila D.S Division and mainly, estate sector Tea cultivation in Pasbage Korale, Medadumbara, Udapalatha, Ganga Ihala Korale, Doluwa, and Deltota D.S Divisions.

Rubber Cultivation acreage in the district is 5,573 Acres (2013/14 Economic census).It is mainly cultivated in Hatharaliyadda. Yatinuwara and Thumpane D.S Divisions. Small Holdings sector represents the 83% of the total rubber cultivation.

Asweddumized Paddy extent in the district is 35,628 acres and 30.2% of it, under the Major irrigation 45.0% and 24.8% acreage under the Minor irrigation and Rainfed correspondingly. The highest acreage under the major irrigation is in Minipe D.S Division Ududumbara D.S Division is reported the highest acreage under the Minor Irrigation.

Among the leading minor export crops in the district, Pepper, Cloves and Coffee are reported the acreages 17475, 7472 and 6821 correspondingly. These crops are profusely grown in Medadumbara, Pujapitiya, Udadumbara, Kundasale, Ganga Ihala Korale, Udunuwara, Hataraliyadda, Doluwa, Pathahewaheta D.S Divisions.

According to the 2013/14 Economic census, Main industries in the district are Textile, wearing, apparel and leather, Food, beverages and tobacco, Wood, wood production and furniture, nonmetallic mineral products. There are several International industries are operated under the BOI (Board of Investment) in Pallekele.

Dependency ratio is 64.0 for Kandy district in 2016 and Child Dependency and Elderly Dependency ratios are 41.8 and 22.2 correspondingly. According to the Household Income Expenditure Survey 2012/13, Mean household income per month is 43,138 Rs. and Median household income per month is 30,371 Rs. in Kandy district. Pre mentioned survey has revealed that Poverty head count index for the district as 6.2%.